*කේ.ඒ.ආර්. ශාලිකා [1], ඕ.අයි.ඩී. වීරනායක [2], යූ.කේ.සී.එම්. එදිරිසිංහ [3], එස්.ටී.එම්. සෙනවිරත්න [4], එච්.එම්.එස්. ඉමංශා [5]*

කුලය යන සමාජ ස්ථරායනය පෙන්නුම් කරනු ලබන ප්‍රමුඛතම සාධකයක් ලෙස පෙන්වාදිය හැකිය.ලාංකේය කුල ක්‍රමය හින්දු කුල ක්‍රමයෙන් බිඳී ආ නමුත් ලාංකේය ජන සමාජයට ආවේණිකව සිංහල කුල ක්‍රමය ඉදිරියට පරිණාමය විය.මහනුවර යුගයේදී කුලය යන නෛතික සංස්ථාවක් බවට පත්ව ඇත.වර්තමාන සමාජය තුල කුලය යන සමාජ ස්ථරායන සාධකය විවෘතව සමාජය නැතහොත් කුටුම්භ තුළ විවෘතව කතාබහට ලක්වන කරුණක් නොව.නමුත් ශ්‍රී ලාංකීය සමාජය තුල කුලය යන සාධකය සම්පූර්ණ ලෙස වර්තමාන සමාජ සංස්ථා තුළින් බැහැරව ගොස් නැත.කාන්තාවකගේ හෝ පුරුෂයෙකුගේ ජීවිතයේ "විවාහය" නැමැති සාධකය තුළදී බොහෝ විට කුලය යන සාධකයට ප්‍රමුඛස්ථානයක් ලබා දීම සිදුවේ. වර්තමානයේ නාගරික ප්‍රදේශවලට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රදේශවල  කුලය යන සාධකය වැඩි වශයෙන් කතාබහට ලක්වන්නක් ලෙස පෙන්වාදිය හැකිය.මෙහි එන අධ්‍යයන ක්ෂේත්‍රය බස්නාහිර  පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වීරගුල ග්‍රාමයේ ගජබා මාවත නොහොත් පණ්ඩිතගම යනුවෙන් හඳුන්වන ප්‍රදේශය ඉලක්ක කර ගනිමින් පර්යේෂණය සිදුකර ඇත.මෙම පර්යේෂණ පත්‍රය මගින් ලංකාවේ කුලය යන සාධකය වර්තමානය වන විට සක්‍රීයව පවතින්නේද යන පර්යේෂණ ගැටලුව පිළිබඳව වීරගුල ග්‍රාමය මුල්කරගත්  සමාජ විද්‍යාත්මක  අධ්‍යයනයක් සිදු කර ඇත.මෙහි ප්‍රධාන අරමුණ ලෙස වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුල කුලය  මත පදනම් වූ සමාජ වෙනස්කම් පවතින්නේද යන්න සොයා බැලීම පිළිබඳවය.අනු අරමුණු ලෙස අධ්‍යාපන අවස්ථා මත කුලය බලපෑම් ඇති කරන්නේද, සාම්ප්‍රදායික වෘත්තිය වූ කුඹල් කර්මාන්තයෙන් පිට වෙනත් රැකියා කරන්නේද,වෘත්තීන් තෝරා ගැනීමේදී කුලය යන සාධකය බලපෑම් එල්ල කරන්නේ ද, වර්තමාන තරුණ පරපුර කුලය යන්න පිළිබඳ දරන මතවාද මොනවාද යන්න පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අනු අරමුණු වේ.මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර ක්‍රමවේදයක් භාවිතා කරනු ලැබීය.ප්‍රාථමික  දත්ත සහ ද්විතීක දත්ත මගින් තොරතුරු ඒකරාශී කරනු ලැබීය.ප්‍රාථමික දත්ත ලෙස නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා මගින් ද ද්විතීක දත්ත ලෙස ග්‍රාම නිලධාරී වාර්තා යොදා ගනු ලැබීය. මෙම පර්යේෂණය සඳහා පවුල් විසිපහක නියැදියක් භාවිතා කර ඇත. නිරීක්ෂණ ක්‍රමවේදය ලෙස සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය මෙහිදී යොදා ගනු ලැබීය. මෙහිදී අරමුණු සහගත නියැදීමේ ක්‍රමයක් භාවිතා කර ඇත.මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස කුලය යන සාධකය විවාහය,දේශපාලනය වැනි සමාජයේ තීරණාත්මක කාර්යයන්හිදී වැඩි වශයෙන්ම ඉස්මතු වන බව පෙනී ගියහ.තරුණ පිරිස් කුලය යන්න වැඩි තැකීමක් නොදක්වන බවද මෙම පර්යේෂණය මගින් සොයාගනු ලැබීය.සාම්ප්‍රදායික සමාජයේ කුලවත් පිරිස් පාරම්පරික වංශවත් බව පෙන්වීමට කුලය අවියක් ලෙස යොදාගන්නා බවට පෙනී ගියහ.ගම අවට සිටින අසල්වාසීන් වැඩි වශයෙන් මෙම පිරිස් සමාජ කොන් කිරීමට ලක්වන බව පෙනී ගියහ.ඒ අනුව මෙමගින්  කුලය වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය තුළ සක්‍රීයව පවතින සංවේදී සමාජ කරුණක් ලෙස නිගමනය කළ හැකි බව පෙන්වා දිය හැකිය.

***ප්‍රමුඛ පදඃ*** ශ්‍රී ලාංකීය සමාජය, කුලය,  විවාහය, අධ්‍යාපනය,  දේශපාලනය

[12345] සමාජීය විද්‍යා අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
ruvinisalikak@gmail.com